# View and Wrong View

The Buddha once told a story about a young man who was a trader and had a beautiful wife and baby son. Sadly, his wife fell ill and died and the man poured all his love into his little child, who became the sole source of his happiness and joy. Once, while he went away on business, bandits raided his village, burned it to the ground and captured his five-year-old son. When he returned and saw the devastation, he was beside himself with grief. He found the charred corpse of a small child and, in his desperation, took it for the body of his son. He tore at his hair and beat his chest and wept uncontrollably. At last, he arranged a cremation ceremony, collected up the ashes, and put them in a very precious silk pouch. Whether he was working, sleeping or eating, he carried that bag of ashes with him, and often he would sit alone and weep for hours on end.

One day his son escaped from the bandits and found his way home. It was midnight when he arrived at his father's new house and knocked on the door. The man lay in bed, sobbing, and the bag of ashes by his side. 'Who is it?' he asked. The child answered. ' It's me Daddy, your son. Open the door'

In his anguish and confusion, all that father could think of was that some malicious boy was playing a cruel trick on him. ' Go away' he shouted.' Leave me alone' Then the boy started to cry once more. Again and again, the boy knocked, but the father refused to let him in. Finally, he slowly turned and walked away. The father and son never saw each other again.

When he came to the end of his story, the Buddha said, ' Some- times, somewhere you take something to be the truth. But you cling to it too strongly, then even when the truth come in person and knocks on your door, you will not open it.'

♦ Sogyal Rinpoche

# තණ්හා

**හැ**ම දෙයක්ම දුක මුලයි. දුකට හේතු තණ්හාව වන බව නිරන්තරයෙන් අප අසා ඇත. තණ්හාව අප තුළ ක්‍රියාත්මක වන අන්දම අප හරිහැටි වටහාගෙන නැත. උපාදානස්කන්ධ මාර්ගයෙන් තණ්හාව හිස ඔසවන විට ඉන්ද්‍රියයන් ඊට රඟන්නට වේදිකාව සකසා දෙයි. ඇසෙන් යමක් දුටුවිට ඊට ආසා ඇතිකර ඉන් අනතුරුව එය සතුකර ගැන්මට හෝ ඇසුරින් තෘප්තියක් ලැබීමට සිත නලියන්නට පටන් ගනී. සිත නලියන විට අසහනයකුදු ඒ හා බැඳී ඒ. මෙය ලබාගන්නට ලැබේදෝ නොලැබේදෝ යන අසහනය සමග තෘෂ්ණාවේ රංගනය ක්‍රෝධ මාන ඊර්ෂ්‍යා සමග වෙස්ගනී. යමක් දැක අප්‍රසන්න වූයේ නම් සිත එය ප්‍රතික්ෂෙපකරන්නට පෙළඹේ නම් උපේක්ෂාව පලායයි. එතැනද අසහනයයි. දරු සෙනෙහස, දරුවන්, දෙමාපියන්, පති පතිනියන්, නෑදෑ හිතමිතුරන් මාර්ගයෙනුදු තණ්හාව නොයෙක් මාදිලියෙන් අප මෙහෙයවයි. සෙනෙහස නොලැබුණු විට දුක කලකිරීම පසුතැවීම ද, සෙනෙහස ලැබුණු විට ඊට බැඳී සතුකරගන්නට වෙහෙසීම ද තෘෂ්ණාව මුල්ව ඇතිවේ. තණ්හාවෙන් දුක මල්පල ගන්වා දුක විඳ විඳත් ඉන් ඈත්වීම අපහසු කරන්නේ පුරුදු තණ්හාවමයි. සංසාරයේ මේ තෘෂ්ණාවෙන්ම වෙළී බැඳී ආරම්භ ගති ඇතිකරගත් අප මේ බැමි සිඳ බිඳලීමේ සටනේදී පරාජයට ඉඩ නොදීමට වගබලාගත යුතු වෙමු.

♦ **සෝමා වෛද්‍යරත්න**
**Washington USA**




# Religions should face investigation

" Experience is the only source of knowledge. The same methods of investigation which we apply to the sciences and to exterior knowledge should be applied to religion. If a religion is destroyed by such investigation, it means that religion is nothing, but a useless and unworthy collection of superstitious beliefs; the sooner it disappeared, the better. Why religions should claim that they are not bound to abide by the standpoint of reason, no one knows…..it is better that mankind should become atheist by following reason than blindly believing in two hundred million gods on the authority of anybody….."

♦ Swami Vivekananda

## ආගම් තර්කානුකූල විමසුමට ලක් විය යුතුය

**අ**ත්දැකීම දැනුම ලැබීමට ඇති එකම මූලාශ්‍රය වෙයි. අප විද්‍යාවට හා බාහිරින් ලබා ගන්නා දැනුම ලැබීමට යොදන පරීක්ෂණ ක්‍රම ආගම ගැන විමසීමේදී ද භාවිතා කළ යුතුය. එසේ පරීක්ෂණයට භාජනය කරද්දී යම් ආගමක් විනාශයට පත් වේ නම් ඉන් හැඟෙන්නේ ඒ ආගම කිසි ප්‍රයෝජනයක් නැති, නොවටිනා, මිත්‍යා ඇදහිලි එකතු කර තැනූ පුහු ආගමක් බවයි. එවැනි ආගමක් අතුරුදහන්ව ගිය තරමට හොඳ ය. තර්කානුකූල පරීක්ෂාවන්ට භාජනය වන්නට තමන් බැඳී නැතැයි ආගම් ප්‍රකාශකර සිටින්නේ ඇයි දැයි කිසිවෙකු නොදනී. .දැනමුත්තන්ගේ. කීම දොහොත් මුදුණින් පිළිගනිමින් අන්ධයින් ලෙස තිස්තුන් කෝටියක් දෙවිවරුන් අදහනවාට වඩා, මිනිස් වර්ගයා, සාධාරණ තර්කානුකූල බුද්ධිය අනුගමනය කරමින් දේව විශ්වාසය අත්හැරීම නුවණට හුරු ය.

♦ **ස්වාමි විවේකානන්ද**

## ලන්ඩන් විහාරාධිපති බෝගොඩ සීලවිමල හිමියන් මහා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන සංඝනායක ධුරයට



**සි**යම් මහා නිකායේ මල්වතු පාර්ශවයේ අනුනායක පූජ්‍ය නියංගොඩ ශ්‍රී විජිතසිරි ස්වාමීන් වහන්සේ විසින් මහා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන සංඝනායක පදවිය පිළිබඳ අක්තපත්‍රය ගිය සතියේ මැයි මස 1 වෙනි දින මහනුවර මල්වතු විහාරයේදී ලන්ඩන් විහාරාධිපති පූජ්‍ය බෝගොඩ සීලවිමල ස්වාමීන් වහන්සේට පිරිනැමූ අවස්ථාව.

*පින්තූරය - සිරිල් විමලසුරේන්ද්‍ර*



**ශ්‍රී** ලංකා ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මහතා බ්‍රිතාන්‍යයේ නව සංඝනායක පූජ්‍ය සීලවිමල නාහිමි යන් අරලියගහ මන්දිරයේ දී පිළිගෙන උන්වහන්සේට ගෞරවාචාර දැක්වූ අයුරුය මේ. මෙම විශේෂ අවස්ථාවට භික්ෂූන් වහන්සේලා සහ විදේශ ඇමති රෝහිත බොගොල්ලාගම මහතා ද සහභාගි වූහ.

*පින්තූරය - සුදත් සිල්වා*

